චීන ජාතිකයෙකු හැඳින්වීම සඳහා "චීන්නු" සහ "චීනුන්" වැනි යෙදුම් බොහෝ විට කටවහරෙහි භාවිතා වේ. මෙවැනි යෙදුමක් පොදුවේ නිෂේධනාත්මක නොවේදැයි අප ඇසිය යුතුවේ. මන්දයත්, "චීන්නු" වැනි යෙදුමක් ඔස්සේ යම් අවමානාත්මක, කොන් කිරීමේ ස්වරයක් ජනිත වන බැවිනි. මාධ්‍ය ඔස්සේ "චීන්නු" වැනි යෙදුම් නිරන්තරයෙන් භාවිතා වීම, විදේශික භීතිකාවක් (xenophobia) ඇතිවීමට පවා රුකුලක් නොවනු ඇතිදැයි එසේම අප ඇසිය යුතු වේ.

පිරමිඩ් ජාවාරමක නිරත වූ චීන ජාතිකයින් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් පුවත් සිරස්තල ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය මෙම පසුතලයේදී විමසා බැලිය හැක.

දිනමිණ, අරුණ සහ ලංකාදීප පුවත්පත් (සැප්තැම්බර් 08, 2023) තුළ පළවූ මෙම පුවත් සිරස්තල තුළ. අදාළ චීන ජාතිකයින්ව, "චීන්නු", "චීනුන්" ලෙස හැඳින්වී තිබිණි.

ඔබ සිතන ආකාරයට,

1) චීන ජාතිකයින් සම්බන්ධයෙන් සෘණාත්මක පසුතලයක වන පුවත් තුළ, "චීන්නු" වැනි යෙදුම් ඔස්සේ චීන ජාතිකයින්ව හැඳින්වීමෙන්, පොදුවේ චීන ජාතිකයින් කෙරෙහි අවමානාත්මක සහ කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ ඇති නොවන්නේ ද?

2) ඒ වෙනුවට වඩාත් යෝග්‍ය යෙදුම වන්නේ "චීන ජාතිකයා" වැන්නක් නොවේ ද?

